**රුහුණ විශ්ව විද්‍යාලය - 2019**
**--------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

රුහුණ විශ්ව විද්‍යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, විශ්ව විද්‍යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය විශ්ව විද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා රුහුණ විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය

----------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති,

පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විශ්වවිද්‍යාලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

----------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

------------------------------------------------------------

ගනුදෙනු කළමානාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමානාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්න්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

------------------------------------------------------------------

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 හි 99 ජේදය ප්‍රකාරව අස්ථිත්වයක ඌනතාවය හෝ අතිරික්තය හඳුනා ගැනීමේදී සියලුම ආදායම් හා වියදම් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයට ඇතුළත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේදී විවිධ ක්‍රියාකාරකම් 07 කින් උපයා තිබුණු රු.28,203,241 ක මුදලක් ආදායම් ලෙස හඳුනාගෙන නොතිබුණි. | එම ක්‍රියාකාරකම් 7 න් උපයනු ලබන ආදායම් මෙහෙයුම් ක්‍රියාකාරම් මගින් ජනිත වූ ආදායම් නොවන බැවින් ඒවා ආදායම් ප්‍රකාශනයට ඇතුළත් නොකරන ලදී. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව අස්ථිත්වයේ සියළුම ආදායම් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයට ඇතුළත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 65 ඡේදය ප්‍රකාරව වත්කමක අවශේෂ වටිනාකම හා ප්‍රයෝජනවත් ජීවිත කාලය අඩු තරමින් සෑම වාර්ෂික වාර්තා කරන කාලපරිච්ඡේදයක් අවසන් වන දිනයේදී සමාලෝචනය කළ යුතු අතර, අපේක්ෂා කරන තත්ත්වයන් ඇස්තමේන්තුවලින් වෙනස් වන්නේ නම් එම වෙනස්වීම් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 ප්‍රකාරව ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනසක් ලෙස ගිණුම්ගත කළ යුතුය. විශ්වවිද්‍යාලයේ පිරිවැය රු.65,884,346 ක් වූ වත්කම් විෂයයන් 02ක් සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබූ අතර මුළු වත්කම් වලින් සියයට 52 ක ප්‍රමාණයකට වඩා වැඩි ප්‍රමාණයක් ඇතුලත් වී තිබුණි. | ඉඩම්, ගොඩනැගිලි හා මෝටර් රථ පමණක් ප්‍රත්‍යාගණන ආකෘතිය යටතේ පවත්වාගෙන යන අතර සුන්බුන් වටිනාකම ශුන්‍ය වූ මෝටර් රථ ඇතුලු වාහන පන්තිය තක්සේරු කර අදාල ගැලපුම් මූල්‍ය ප්‍රකාශනයන්හි සිදුකිරීමට අපේක්ෂිතය. අනෙකුත් වත්කම් 41 වගන්තිය අනුව පිරිවැය ආකෘතිය යටතේ පවත්වාගෙන ඇති හෙයින් වාර්ෂික අවශේෂ වටිනාකම හා ප්‍රයෝජනවත් ජීවකාලය සමාලෝචනය කිරීමේ අවශ්‍යතාවයක් පැන නොනගී. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 69 ඡේදය අනුව වත්කමක් ක්ෂය කිරීම ආරම්භ වන්නේ එය පාවිච්චි කිරීම සඳහා සූදානම් තත්ත්වයට ගෙන ආ පසුව වුවද සමාලෝචිත වර්ෂයේදී මිලදී ගත් වත්කම් පන්තීන් 05 ක් වෙනුවෙන් සම්පූර්ණ වර්ෂයටම ක්ෂය ගණනය කිරීම හේතුවෙන් රු.1,824,990 ක් ක්ෂය වැඩියෙන් දක්වා තිබුණි. | ක්ෂය ගණනය කිරීමේ දෝෂයක් වන අතර අදාළ නිවැරදි කිරීම් 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයන්හි අදාල සංශෝධනයන් සිදු කරනු ඇත. | ගිණුම්කරණ ප්‍රමිතය ප්‍රකාරව ක්ෂය ගණනය කිරීම සිදු කළ යුතුය. |

**1.5.3 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විශ්වවිද්‍යාලයේ පිය 02 ක් පවත්වාගෙන යන අක්කර 13ක ඉඩම විධිමත් පරිදි පවරාගෙන තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට හෝ සටහනක් මගින් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට හෝ කටයුතු කර නොතිබුණි. | අදාළ ඉඩම් නිත්‍යානුකූලව විශ්වවිද්‍යාලයට පවරා නොමැති හෙයින් මූල්‍ය ප්‍රකාශනයන්ට ඇතුළත් නොකළ අතර, මේ සම්බන්ධයෙන් සංශෝධිත සටහනක් 2020 මූල්‍ය ප්‍රකාශනයන්හි ඇතුළත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ඇත. | නීත්‍යානුකූලව පවරාගෙන නොමැති වුවද දැනට භුක්තිවිදින බැවින් ඒ බව මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කළ යුතුය. |
| (ආ) | පොදු සංචිතය සඳහා වූ වෙනත් ගැලපුම් ශේෂය රු.20,430,979 ක් වුවද එය රු.33,649,717 ක් ලෙසත් ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දේපළ පිරියත හා උපකරණ අත්පත් කර ගැනීම් රු.144,661,558 ක් වුවද එය රු.157,880,296ක් ලෙසත් දැක්වීම හේතුවෙන් එම වටිනාකම් රු.13,218,738ක් වැඩියෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ දක්වා තිබුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ සමස්ථ ප්‍රවාහයට ඉහත ගැලපීම හේතුවෙන් බලපෑමක් නොමැති අතර මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී පූර්ව වර්ෂයන්හි වත්කම් සඳහා සිදුකරන ලද මුදල් නොවන ගනුදෙනු (Non cash transaction) ගැලපීමේදී සිදු වූ දෝෂයක් හේතුවෙන් මෙය සිදු වී ඇති අතර, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සශෝධනය කර ඉදිරිපත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ඇත. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ඇ) | ගිවිසුම් ප්‍රකාරව කටයුතු නොකිරීම හේතුවෙන් සැපයුම් කරුවන්ගෙන් අයකල ප්‍රමාද ගාස්තු අදාල වර්ෂයේ ආදායම් ලෙස හඳුනා ගැනීමෙන් තොරව පාලන අධිකාරිය අරමුදල් ගිණුමකට බැර කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ ආදායම රු.3,160,753ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු අතර, 2012 වර්ෂයේ සිට 2019 දෙසැම්බර් 31 දිනට එම අරමුදල් ගිණුමේ ශේෂය රු.13,256,051 ක් විය. | 2012 වර්ෂයේ සිට අයකර ගන්නා ලද සියලු ගිවිසුම් හා බැදුම්කර කඩ කිරීමෙන් අයකරගත් මුදල් මෙසේ අරමුදල් ගිණුමකට මාරු කර සැපයුම් හා කාර්ය මණ්ඩල ගිවිසුම හා බැදුම්කර කඩ කිරීමෙන් ලද මුදල් එකම ලෙජර් ගිණුමක පවත්වාගෙන ආයෝජනය සිදු කර ඇත. ඉදිරියේදි අවශ්‍ය නිවැරදි කිරීම සිදු කරනු ඇත. | අයකළ ප්‍රමාද ගාස්තු විශ්වවිද්‍යාලයේ ආදායමක් ලෙස හඳුනා ගත යුතුය. |
| (ඈ) | 2015 ජුලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් | භාණ්ඩාගාරයෙන් වාර්ෂික ප්‍රතිපාදන ප්‍රමාණවත් ලෙස | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| වක්‍රලේඛය අනුව වාහන විකිණීමෙන් ලැබෙන සියළුම ආදායම් ඒකාබද්ධ අරමුදලට බැර කළයුතු වුවත්, එසේ විශ්වවිද්‍යාලය කටයුතු නොකර වාහන විකිණීමේ අරමුදලකට බැර කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසානයට එම අරමුදලේ ශේෂය රු.5,203,365 ක් විය. | නොලැබීම හේතුවෙන් ඉහත මුදල් ආපසු නොගෙවා රඳවාගෙන ඇති අතර, ඉදිරියේදි වාහන විකිණීමෙන් ලද ආදායම් ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරනු ඇත. | |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ගෙවිය යුතු මුදල්**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2015 වර්ෂයේ සිට පැවත එන එකතුව රු.2,925,616 ක් වූ ණයහිමියන් හිමිකම් නොපෑම සම්බන්ධව පරීක්ෂා කර සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි. | අදාල ණයහිමි ශේෂය සම්බන්ධව සැපයුම් අංශ දැනුවත් කර එම ශේෂයන් නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ඉදිරියේදී ගනු ඇත. | ණය හිමි ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ මුල්‍ය ප්‍රකාශන අනුව, නොගෙවූ ශිෂ්‍යාධාර රු. 9,790,750 ක් වූ අතර, ඒ තුල 2011 වර්ෂයේ සිට 2015 වර්ෂයට අදාල නොගෙවූ ශිෂ්‍යාධාර රු. 9,535,050ක් විය. එම ශිෂ්‍යාධාර ගෙවීම සඳහා පාලන අධිකාරියේ අවධානය යොමුකර නොතිබුණි. | නොගෙවූ ශිෂ්‍යාධාර ශේෂයේ වූ මුදල් වෙනම ගිණුමක පවත්වාගෙන නොමැති අතර ඉකුත් වර්ෂයන්හි ප්‍රමාණවත් ලෙස පුනරාවර්තන අරමුදල් නොලැබීම හේතුවෙන් එම මුදල් පුනරාවර්තන ගෙවීම් සඳහා උපයෝජනය වී ඇති අතර ප්‍රමාණවත් අරමුදල් රැස් වූ පසු අදාල මුදල ප්‍රතිපාදන සැලසූ ආයතනයට නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ඇත. | ශිෂ්‍යාධාර සඳහා ලැබෙන අරමුදල් ආයතනයේ පුනරාවර්ථන කාර්යයන් වෙනුවෙන් උපයෝජනය නොකළ යුතු අතර නොපමාව නිරවුල් කිරීමට ක්‍රියා කළ යුතුය. |

**1.7 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ V වන කොටසේ 29 (ඊ) වගන්තිය | විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයින් නොවන තැනැත්තන්ට විශ්වවිද්‍යාලයේ උපාධි අභිඥාණ පත්‍ර හා වෙනත් ස්ත්‍රීය විශිෂ්ඨතා ලබා ගැනීමට හැකිවන පරිදි කොමිෂන් සභාවේ එකඟත්වය ඇතිව බාහිර විභාග පැවැත්වීමට හැකි බවට දක්වා තිබුණද, ශාස්ත්‍රවේදී බාහිර උපාධි පාඨමාලාව හැර වෙනත් උපාධි පාඨමාලා ආරම්භ කිරීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමු වී නොතිබුණි. | දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය මගින් ශාස්ත්‍රවේදී (බාහිර) උපාධිය පමණක් දැනට පිරිනමනු ලබන අතර වාණිජවේදී (බාහිර) උපාධියක් පිරිනැමීම සඳහා සනාතන සභාවේ අනුමැතිය මත කළමනාකරණ හා මූල්‍ය පීඨයේ සහයෝගයෙන් පාඨමාලාව ආරම්භ කිරීමට අපේක්ෂිතය. | කාලීන අවශ්‍යතාවයන්ට සරිලන පරිදි උපාධි පාඨමාලා හඳුන්වාදීම හා පැවැත්වීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | (i) මුදල් රෙගුලාසි 394 (ඇ) | අවලංගු කරන ලද චෙක්පත් වටිනාකම දෙපාර්තමේන්තුවට ලැබුණු මුදලක් ලෙස සැලකිය යුතු අතර, එය නියමිත ගිණුමට බැර කළ යුතුය. නමුත් විශ්වවිද්‍යාලයේ පීඨ හා ඒකක 08 කට අදාළව 2016 වර්ෂයේ සිට 2019 දෙසැම්බර් 31 දක්වා රු. 1,384,555ක් වටිනා චෙක්පත් 301ක් අවලංගු කර තිබුණු අතර, මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මු.රෙ 392 ප්‍රකාරව එම චෙක්පත් සඳහා හිලව් චෙක්පත් නිකුත් කිරීමට සිදුවන හෙයින් තාවකාලිකව අවලංගු චෙක්පත් ගිණුමට මාරු කර ඇති අතර, එම චෙක්පත් වෙනුවෙන් හිලව් චෙක්පත් නිකුත් නොකරන බව තහවුරු කර ගැනීමෙන් පසු මු.රෙ 394 අනුව කටයුතු කරනු ඇත. | චෙක්පත්හි වලංගු කාලය ඉක්මවා ඇති විට එම චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | (ii) මුදල් රෙගුලාසි අංක 751,752 හා 754 | රෙගුලාසි ප්‍රකාරව බඩු ලේඛන පොත් පවත්වා ගෙන ගොස් නොතිබුණි. | නඩත්තු අංශය සඳහා ගබඩා පාලක තනතුරක් ඇති කිරීමට අපේක්ෂිත වන අතර දැනට සුළු සේවකයෙකු ගබඩා අංශයේ කටයුතු සඳහා යොදා ඇති අතර නිලධාරියෙකු බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ඇ) | විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ 40.1 වගන්තිය | උසස් අධ්‍යාපන ආයතනයේ විවේක කාලවලදී නිවාඩු ගැනීමෙන් තමාගෙන් අදාළ ආයතනයට වියයුතු සේවයට අහිතකර බලපෑමක් ඇති නොවන්නේ නම්, යම් ආචාර්යවරයෙකුට විවේක කාලවලදී නිවාඩු ලබා ගත හැකිය. ඉංජිනේරු පීඨයේ ආචාර්යවරයෙකුට අධ්‍යයන කාලය තුළදී එනම් 2018 සැප්තැම්බර් 6 සිට 2018 දෙසැම්බර් 05 දක්වා හා 2019 ජනවාරි 12 සිට 2019 අප්‍රේල් 11 දක්වා වැටුප් සහිත විවේක නිවාඩු අනුමත කර තිබුණි. නමුත් මෙම කාලයන් දෙකම අධ්‍යයන කාලයන් වන බවත් අඛණ්ඩව අවස්ථා 02 කදී විවේක නිවාඩු ලබා ගෙන ඇති බවත් නිරීක්ෂණය කෙරේ. | අදාල ආචාර්යවරයා 2019.01.01 දින සේවයට වාර්තා කර ඇති අතර නැවත 2019.01.12 දින සිට 2019.04.11 දින දක්වා මාස 03ක විවේක නිවාඩු ලබාගෙන ඇත. 2019.01.14 දින පැවති 387 වන පාලක සභාව විසින් ඒ මහතාගේ නිවාඩු අනුමත කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි. | නිලධාරීන්ට නිවාඩු ලබා දීමේදී අයතන සංග්‍රහයේ අවශ්‍යතාවයන්ට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2019 ජුලි 25 දිනැති අංක SC & PMU/ GRANT/19 දරන විදේශ සම්පත් දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය | වෙනත් රාජ්‍යයන් /විදේශ සංවර්ධන පාර්ශවකරුවන්, විදේශ ආයතන ලබාදෙනු ලබන විදේශ ප්‍රදානයන් හා ශිල්පීය ආධාර විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හරහා එම දෙපාර්තමේන්තුවේ අනුදැනුම හා එකඟතාවය මත ලබාගත යුතු බවට දක්වා තිබේ. එසේ වුවද විශ්වවිද්‍යාලය තුළ සමාලෝචිත වර්ෂයේ අවසානය වන විට රු.131,440,631 ක ව්‍යාපෘති 08 ක් ක්‍රියාත්මකව පැවතියත් එලෙස එකඟතාවය ලබාගෙන නොතිබුණි. | ඉදිරියේදී විදේශ ප්‍රදාන ලබා ගැනීමේදී විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අනුදැනුම හා එකඟතාවය මත ලබා ගැනීමට කටයුතු කරනු ඇත. | නියමිත අනුමැතිය මත විදේශ ප්‍රදාන ලබාගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඉ) | 2014 මාර්තු 25 දිනැති අංක 05/2014 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයෙහි 5(1) ඡේදය | විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ට පර්යේෂණ ආධාර හා පර්යේෂණ දීමනා ගෙවීමේදී පර්යේෂණ කළමනාකරණ කමිටුව විසින් යෝජිත පර්යේෂණ මාතෘකාවේ ඵළදායීතාවය ඇගයීම හා පර්යේෂණයේ කාලය තීරණය කිරීම සිදුකල යුතු වුවද පර්යේෂණ කළමනාකරණ කමිටුව විසින් වාර්තා ඇගයීම් සිදුකර නොතිබුණි. 2018 හා 2019 වර්ෂවල පර්යේෂණ දීමනා වලට අදාළ පර්යේෂණ පත්‍රිකා 2020 ජනවාරි 20 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. | පර්යේෂණ දීමනා ගෙවීමේදී යෝජිත පර්යේෂණ හා පර්යේෂණ වාර්තා සැලකිල්ලට ගනී. තවද පර්යේෂණ සිදුකල පසු නව සොයාගැනීම් සඟරා වල ලිපි ලෙස පල කරනු ලබයි. සෑම පර්යේෂණ යෝජනාවලියක්ම පර්යේෂණ ආධාර කමිටුව විසින් ඇගයීමකට භාජනය කරනු ලබන බව ඔබ වෙත කාරුණිකව දන්වමි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පර්යේෂණ කළමනාකරණ කමිටුව විසින් පර්යේෂණයේ ඵලදායීතාවය පිළිබඳව සැලකිලිමත් විය යුතුය. |

## 1.8 මුදල් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 45 වගන්තියේ XV ඡේදය හා 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වන වගන්තියට අනුව මුදල් අමාත්‍යවරයාගේ එකඟත්වය සහිතව අදාල අමාත්‍යවරයාගේ හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ එකඟත්වය ලබා නොගෙන කිසිදු මුදලක් ආයෝජනය නොකළ යුතු වුවද, ඊට අනුකූල නොවන පරිදි විවිධ අරමුදල් ගිණුම්වල ඇති මුදල් ස්ථාවර තැන්පතුවල හා මුදල් වෙළඳපොලේ ආයෝජනය කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට එහි ශේෂ එකතුව රු.287,174,469 වී තිබුණි. | විගණනය විසින් දක්වා ඇති ආයෝජනයන් විශ්වවිද්‍යාල පනතේ 45 හි 02 වගන්තියේ II හා XV ඡේද ප්‍රකාරව පාලක සභා බලතල යටතේ හා එක් එක් අරමුදල් හි අරමුණ අනුව විවිධ අනුමැතීන්ට යටත්ව මුදල් ආයෝජනය කර ඇති අතර, මේ සඳහා මහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරනු ඇති බව කාරුණිකව දන්වමි. | නිසි අනුමැතිය මත ආයෝජන සිදිකළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 381 අනුව භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීමෙන් පසුව රාජකාරී බැංකු ගිණුමක් විවෘත කළ යුතු වුවත්, එසේ කටයුතු නොකර 2017 වර්ෂයේ බැංකු | විගණනය විසින් දක්වා ඇති බැංකු ගිණුම් ජංගම බැංකු ගිණුම් නොවන අතර කිසිදු චෙක්පත් ගනුදෙනුවක් සිදු නොවන බැවින්ද , භාණ්ඩාගාර අරමුදල් උපයෝජනය නොවීමත් රාජකාරි බැංකු | රාජ්‍ය ආයතනයක් විසින් ආරම්භ කරනු ලබන සියලුම ගිණුම් රාජකාරි බැංකු ගිණුම් වන බැවින් මුදල් රෙගුලාසි ප්‍රකාරව භාණ්ඩාගාරයේ අවසරය ලබා ගත යුතුය. |

| | |
|---|---|
| ගිණුම් 02 ක් හා 2019 වර්ෂයේ බැංකු ගිණුම් 04ක් ආරම්භකර තිබුණි. සමාලෝචිත වර්ෂයේ අවසාන වන විට මෙම ගිණුම් 06හි එකතුව රු.132,088,062 ක ශේෂයක් පැවතුණි.. | ගිණුම් නොවීමත් හේතුවෙන් භාණ්ඩාගාරයේ අනුමැතියට යොමු කර නොමැත. පාලක සභා අනුමැතියන් මත අදාල ගිණුම් ආරම්භ කර ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.828,409,127 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.134,979,328 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.693,429,799 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට පාරිභෝගික සේවා සඳහා වෙන්කිරීම, රු.675,903,643 කින්ද කොන්ත්‍රාත් සේවා වියදම රු.67,817,034 කින් හා පුද්ගල පඩිනඩි රු. 770,567,662 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා අධ්‍යනාංශය හා නෝර්වේ ඇන්ඩර් විශ්වවිද්‍යාලය අතර ඇතිකර ගනු ලැබූ අවබෝධතා ගිවිසුමක් යටතේ වාර්ෂිකව පශ්චාත් උපාධිය හදාරණ සිසුන් කිහිප දෙනෙකු සඳහා නෝර්වේ ඇන්ඩර් විශ්වවිද්‍යාලයට යාමට ශිෂ්‍යත්වයක් පිරිනැමීම සිදුකෙරේ. මේ සඳහා ආර්ථික විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව හදාරණ සිසුන් සඳහා අවස්ථාව හිමිව තිබුණි. 2019 වසර සඳහා මෙම ශිෂ්‍යත්ව පිරිනැමීමේ සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලබාදීමේ නිර්ණායක ලෙස ආධුනික කථිකාචාරයවරුන් බඳවා ගැනීමේදී ලකුණු ලබාදෙන නිර්ණායකම අනුගමනය කර තිබුණි. උදාහරණ ලෙස පශ්චාත් උපාධි ඩිප්ලෝමාව, AAT හා වරලත් ගණකාධිකාරී | නෝර්වේ ඇන්ඩර් විශ්වවිද්‍යාලය මඟින් පවත්වනු ලබන මෙම පශ්චාත් උපාධි පාඨමාලාව ගෝලීය සංවර්ධනය සහ සැලසුම් කරනය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාවක් වන අතර, AAT හෝ අධ්‍යාපන පරිපාලනය සම්බන්ධ වෘත්තීය හෝ පශ්චාත් උපාධි පාඨමාලා හදාරා තිබීම අතිරේක සුදුසු කමක් ලෙස සැලකීමට සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය කටයුතු කර ඇත. | මෙවැනි පාඨමාලා සඳහා සුදුසු සිසුන් තේරීම සඳහා ලකුණු ලබාදීමේදී උචිත නිර්ණායක පිහිටුවා ආර්ථික විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධිය හදාරණ සිසුන්ට අසාධාරණයක් නොවන ආකාරයට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | විභාගයේ Strategic Level - II මට්ටමට සමාන කොට සලකා ලකුණු ලබාදීම උචිත නොවන බව නිරීක්ෂණය විය. | | |
| (ආ) | විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා අධ්‍යනාංශයට ආර්ථික විද්‍යාව හා සමාජ සංඛ්‍යානය සඳහා තාවකාලික ආචාර්යවරුන් බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවා තිබුණු අතර, සමාජ සංඛ්‍යානය විෂයය සඳහා ශාස්ත්‍රවේදී හෝ විද්‍යාවේදී ( විශේෂ) සංඛ්‍යාන උපාධිය සහ විද්‍යාවේදී (විශේෂ) සංඛ්‍යානය විෂය සමඟ උපාධියක් හිමි අයට අයදුම් කළ හැකිව තිබුණි. සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබාදීමේදී පශ්චාත් උපාධිය සම්පූර්ණ කළ අයදුම් කරුවකු සඳහා පරීක්ෂණ මණ්ඩලයේ පරීක්ෂකවරු තිදෙනා ලකුණු 0ක්, 05ක් හා 10ක් වශයෙන්ද temporary Demonstrator වශයෙන් වසර 02ක් හා ගුරුවරියකු වශයෙන් වසර 21/2 ක සේවා කාලයක් හිමි අයදුම්කරුවකුහට Profesional enperience සඳහා හිමි ලකුණු 10න් පරීක්ෂකවරු තිදෙනා ලකුණු 0ක්, 2ක් හා 2ක් වශයෙන් ලබාදී තිබුණු අතර,Temporary Demonstrator වශයෙන් මාස 08 ක පළපුරුද්දක් හිමි අයදුම්කරුවකු හට පරීක්ෂකවරු තිදෙනා විසින් ලකුණු 3ක්, 2ක් හා 1 ක් වශයෙන් ලකුණු ලබාදී තිබුණි. තවද Research and Publications සඳහා ලකුණු ලබාදීමේදී විද්‍යාවේදී විශේෂ උපාධියට අමතරව වසර 02ක පශ්චාත් උපාධියක් හිමි අයදුම් කරුවකු සඳහා පරීක්ෂක මණ්ඩලය විසින් එකම ලකුණක් හෝ ලබා දී නොතිබුණි. | සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටි අපේක්ෂකයින් විසින් හදාරණු ලැබූ පශ්චාත් උපාධි, පශ්චාත් උපාධි ඩිප්ලෝමා ආදිය අධ්‍යනාංශ පාඨමාලා අවශ්‍යතාවයන් ප්‍රමාණවත් පරිදි ආවරණයට පිටුවහලක් නොවූ බැවින් විවිධත්වයකින් යුක්තව අපේක්ෂකයින් හට ලකුණු ලබා දීමට සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් කටයුතු කර ඇත.<br>තවද තාවකාලික පදනමින් තෝරා ගැනීමේ දී වඩාත් සැලකිලිමත් වූයේ සමාජ සංඛ්‍යානය පාඨමාලාවේ විෂය ධාරාවට සෘජුවම සම්බන්ධතාවයක්ඇති අපේක්ෂකයන් තෝරා ගැනීමයි. එසේ නොමැතිව අත්දැකීම් හෝ වෙනත් සුදුසුකම් තිබූ පමණින් එය අධ්‍යයනාංශයේ අවශ්‍යතාවන්ට ප්‍රමාණවත් සුදුසු සාධකයක් නොවීය. | සමාන සුදුසුකම් සඳහා සෑම අයදුම් කරුවකුටම සම අවස්ථා හිමිවන ආකාරයට ලකුණු ලබාදීම සිදුකර සුදුසුම අයදුම්කරු තේරීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමුවිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | බාහිර උපාධි පාඨමාලාවේ විෂය නිර්දේශයන් වෙනස් විය යුතු බවට 2013 වර්ෂයේදී හඳුනාගෙන ඒ සඳහා මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයේ, පීඨ මණ්ඩලය හා සනාතන සභාව අවස්ථා කිහිපයකදීම උත්සාහ දරා තිබුණ ද, සමාලෝචිත වර්ෂයේ ඔක්තෝබර් මාසය දක්වාම විෂය නිර්දේෂය වෙනස් කිරිම ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වී තිබුණි. | වර්තමානයේ නවීකරණය වූ ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධිය තුළ වර්තමාන ව්‍යාපාර පරිසරයට අදාළ වන පරිදි තොරතුරු තාක්ෂණය, ගණිතය, ව්‍යාපාර සංඛ්‍යානය සහ ඉංග්‍රීසි යන ක්ෂේත්‍රයන්ගේ නව විෂයයන් ඇතුලත් කර ඇත. | කාලීනව රටේ අවශ්‍යතාවයට ගැලපෙන ආකාරයට විෂය නිර්දේශයන් සංශෝධනය කර පාඨමාලාවෙ ගුණාත්මකභාවය ආරක්ෂා කිරීමට ක්‍රියා කළ යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

----------------------------

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධ්‍යාපන හා පර්යේෂණ කටයුතු සඳහා ප්‍රවේශ මාර්ග පුළුල් කිරීම, අධ්‍යාපන හා පර්යේෂණ කටයුතුවල ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීම, අධ්‍යාපන හා පර්යේෂණ අදාළත්වය වර්ධනය කිරීම විශ්වවිද්‍යාලයේ ප්‍රධානතම අරමුණ වුවත් රුහුණ විශ්වවිද්‍යාලයේ, මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය සහ කළමනාකරණ හා මූල්‍ය පීඨයේ ආචාර්යවරුන් පර්යේෂණවලට යොමු වීම, පර්යේෂණවල ගුණාත්මක භාවය පාලනය, පර්යේෂණවල අදාළත්වය සහ ඒවායේ ප්‍රතිඵල අදාළ පර්ශව වෙත සන්නිවේදනය වීම ඉතා දුර්වල මට්ටමක පැවතුණි. | දැනට පීඨය මඟින් වාර සඟරාවක් වසරකට කලාප 2 ක් සහිතවද ඉලෙක්ට්‍රොනික වාර සඟරාවක් වසරකට කලාප හතර බැඟින්ද ජාත්‍යන්තර මට්ටමේ පර්යේෂණ සැසින්ද විශ්වවිද්‍යාල මඟින් පවත්වනු ලබන අධ්‍යයන සැසියන් හරහාද පර්යේෂණ ලිපි සැපයීමට දායකත්වය සපයමි.<br><br>පර්යේෂණ ලිපි වල ගුණත්වය පාලනය කිරීම සඳහා පිළිගත් ප්‍රමිතීන්ට අනුව බාහිර නිරීක්ෂකයන් දෙදෙනෙකු විසින් ඇගයීමට ලක් කරනු ලැබේ. එබැවින් ගුණත්වයෙන් අඩු පර්යේෂණ ලිපි එළි දැක්වීම පාලනය වේ. | විගණනයට භාජනය කළ පීඨ දෙකේ පර්යේෂණ කමිටු නිර්දේශ ඇතුළත් ගොනුවක් විගණනයට ඉදිරිපත් නොකළ අතර ඉදිරිපත් කළ පර්යේෂණ යෝජනා හා පර්යේෂණ පත්‍රිකා දෙස බැලීමේදී පර්යේෂණවල ගුණාත්මක භාවය, අදාළත්වය හා ඒවායේ ප්‍රතිඵල ක්ෂේත්‍රයට ලඟා වීම පිළිබඳ විධිමත් පාලනයක් නොතිබූ බැවින් ඒ කෙරෙහි අවධානය යොමු කළ යුතුය. |
| (ආ) | Norhed/CPDS යටතේ සාමය හා සංවර්ධන අධ්‍යයනය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාවක් පැවැත්වීමට නෝර්වේ රජය මඟින් අනුග්‍රහය ලබාදී තිබුණි. ඒ තුලින් වර්තමාන සමාජයේ පවතින සමාජ ගැටළු සමාජ විද්‍යාත්මක | මෙම ව්‍යාපෘතියෙන් සාමය සහ සංවර්ධන අධ්‍යයන පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාවක් ආරම්භ කිරීමට සැලසුම් කර සියලු විෂය නිර්දේශ සකස් කර යෝජනාවලියක් ද ඉදිරිපත් | මෙම පාඨමාලාව ශිෂ්‍යත්ව ක්‍රමයක් මත ක්‍රියාත්මක කරන බැවින් එහි ප්‍රතිඵල රටට යොදා ගැනීමට හැකිවන ආකාරයේ සිසුන් බඳවා ගැනීමට සැලසුම් කිරීමට |

| | | | |
|---|---|---|---|
| | ප්‍රවේශයකින් අධ්‍යයනය කිරීමට අපේක්ෂා කරන අතර, සමාජ ගැටළු සමාජීය නිර්මතියක් ලෙස ගොඩනැගෙන්නේ කෙසේද යන්නත්, එවැනි ගැටළු විද්‍යාත්මක දෘෂ්ඨිකෝණයකින් දකින්නේ කෙසේද යන්නත් පිළිබඳ විශේෂ අවධානයක් යොමු කෙරේ. ඒ අනුව මෙම පශ්චාත් උපාධි පාඨමාලාව සමාජ ගැටුම් සමඟ සෘජුවම සම්බන්ධ වෘත්තීන්හි නියැලෙන පාර්ශවයන්ට යෝග්‍ය පාඨමාලාවක් වුවද උපාධි අපේක්ෂකයින් තෝරා ගැනීමේදී එවැනි සාධක කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි. | කර සනාතන සභාවේ සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගන්නා ලදී. විශ්වවිද්‍යාලයේ පවත්නා පරිපාලන පරිපාටින්ට අනුව එම පාඨමාලාව පවත්වාගෙන යාමේ වගකීම ව්‍යාපෘතියේ කාර්යයක් නොවුන අතර පාඨමාලාවට සිසුන් තෝරා ගැනීම, පාඨමාලා ගාස්තු තීරණය කිරීම වැනි කරුණු ව්‍යාපෘති සීමාවන්ගෙන් පරිබාහිර වේ. | වැඩි ප්‍රමුඛත්වයක් ලබාදිය යුතුය. මෙම ක්ෂේත්‍රය හා සම්බන්ධව වෘත්තීයෙහි නියලී සිටින අයට හා ඇතුළත් වීමට අදහස් කරන අය කෙරෙහි විශේෂ අවධානය යොමුකර පාඨමාලාව සැලසුම් කල යුතුය. |
| (ඇ) | සාමය හා සංවර්ධනය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව සමාසික 04 කින් සමන්විත වන අතර, තෙවන සමාසිකයේ අධ්‍යයන කටයුතු නේපාලයේ Tribhuvan විශ්වවිද්‍යාලයේ හැදෑරීමට සීමිත සිසුන් පිරිසකට ශිෂ්‍යත්ව අවස්ථා ලබාදී තිබුණි. එහිදී සුදුසු සිසුන් තේරීම සඳහා උචිත නිර්ණායක ස්ථාපිත කර නොතිබුණි. ස්ථාපිත ලකුණු ලබාදීමේ නිර්ණායක ක්‍රියාත්මක කිරීමේදී ද රුහුණ විශ්වවිද්‍යාලයේ හා ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රවේදී උපාධි සහිත සිසුන් 05ක් සඳහා උපාධියේ ස්වභාවය සඳහා හිමි සම්පූර්ණ ලකුණු 10 ම ලබාදී තිබුණු අතර, රුහුණු විශ්වවිද්‍යාලයේ විද්‍යාවේදී උපාධියක් හිමි සිසුවකුට හා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රවේදී උපාධියක් හිමි සිසුවකුට ලකුණු ලබාදී නොතිබුණි. තවද, පළමු උපාධිය සඳහා ලකුණු ලබාදී නොතිබුණු සිසුවකු සඳහා පශ්චාත් උපාධියක් සඳහා ලකුණු 02 ක් ද, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සංවර්ධන සහකාර තනතුරක රාජකාරී ඉටුකරන නිලධාරියෙකු සඳහා ඉගැන්වීමේ පළපුරුද්ද සඳහා ලකුණු 04 ක් ද ලබාදී තිබීමෙන් ඒකාකාරී ලකුණු ලබාදීමේ ක්‍රමයක් නිරීක්ෂණය නොවීය. | මෙම ව්‍යාපෘතිය මගින් ශිෂ්‍යත්ව ලබා දීමේදී ප්‍රධාන වශයෙන් අනුගමනය කරනු ලබන ක්‍රියා පටිපාටියක් වන්නේ එම ශිෂ්‍යත්ව ලාභින් පාඨමාලාව සම්පූර්ණ කිරීමෙන් පසු විශ්වවිද්‍යාල සේවයට අනුයුක්ත කර ගැනීමේ හැකියාවයි. ඒ අනුව වසර 04ක සමාජීය විද්‍යා විෂය ක්ෂේත්‍රය සහිත උපාධියක් ලබා තිබීම,ගෞරව සාමාර්තයක් ලබා තිබීම වැනි කරුණු කෙරෙහි ප්‍රමුඛතාව ලබාදේ. එසේම රැකියාවේ ස්වභාව සහ පශ්චාත් ඉගැන්වීමේ පළ පුරුද්ද උපාධිය හා යම් මට්ටමකට සමපාත වන බව සලකා බලා කටයුතු කර ඇති බව පාඨමාලා සම්බන්ධීකාරක විසින් දන්වා ඇත. | මෙවැනි උපාධි පාඨමාලාවන්හි ශිෂ්‍යත්ව පිරිනැමීමේදී උචිත නිර්ණායක ස්ථාපිත කර ඒ අනුව සුදුසුම සිසුන් තේරීම කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | උක්ත පශ්චාත් උපාධි පාඨමාලාවේ දෙවන ශිෂ්‍ය කණ්ඩායමේ පළමු සමාසිකයේ විෂයයන් 05ක දේශන පැය 33ක් ද දෙවන සමාසිකයේ විෂයන් 05ක දේශන පැය 33ක් සහ තෙවන සමාසිකයේ විෂයයන් 05ක දේශණ පැය 71 ක්ද ද ආවරණය කර නොතිබුණු අතර විභාග පවත්වා තිබුණි. | පශ්චාත් උපාධි පීඨය විසින් දැනට කරුණු පරීක්ෂා කරමින් පවතින අතර එම කාලපරිච්ඡේදය තුළ සිටි පාඨමාලා සම්බන්ධිකාරකවරු සම්බන්ධ කර ගැනීම අපහසු වීම තුල නිවැරදි තොරතුරු ලබා දීම මේ අවස්ථාවේ අපහසු වී ඇත. විශ්වවිද්‍යාලය යථා තත්ත්වයට පත් වූ වහාම අවශ්‍ය තොරතුරු ලබා දීමට කටයුතු කරනු ලබන බව කාරුණිකව දන්වා සිටිමි. | සියලුම විෂය කරුණු ආවරණය කිරීමෙන් පසුව විභාග පැවැත්වීම සිදුකළ යුතුය. |
| (ඉ) | (i) කුරුඳුවල අගය එකතු කිරිම තුළින් ගුණාත්මකව කුරුඳුවල අපනයන වෙළඳපොළ වැඩිකර සුළු අපනයන ආර්ථිකය ශක්තිමත් කිරීම ප්‍රධාන අරමුණු කරගත් ව්‍යාපෘතියක් ජාතික විද්‍යා පදනම විසින් ආරම්භ කර තිබුණි. ප්‍රදේශය, කුරුඳු වර්ගය ,වයස සහ තැන්පත් කරන ලද කාලයට අනුව කුරුඳුවල රසායනික සංයුතිය, ජීව ක්‍රියාකාරී සංඝටකවල වෙනස්වීම අධ්‍යයනය කර වඩාත් ඵලදායී ප්‍රභවය හා ප්‍රදේශය, කුරුඳු නෙලා ගැනීමට සුදුසු කාලය, බෙහෙත් සෑදීමට අවශ්‍යතැන්පත් කාලය අනුව වඩාත් ඵලදායී කුරුඳු අමුද්‍රව්‍ය නිර්දේශ කිරීම විශ්වවිද්‍යාලයට පැවරී තිබුණි. ව්‍යාපෘති කාලයෙන් ¾ ක කොටසක් අවසන් වී ඇතත් ඉදිරිපත් කර තිබුණු ප්‍රගති වාර්තා අනුව Biochemical Profile එකට අදාළව Profile 50කින්,Profile 02 කට අදාළව පමණක් පරීක්ෂා කර තිබුණි. | මෙම කරුණු සම්බන්ධව එස්එන්පී/එම්ආර්/සී/රු.19/වි12 විගණන විමසුමට අදාල නිරීක්ෂණයන් පිළිබඳව විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ විශේෂ අවධානයට යොමු කරමින් කටයුතු කරමින් පවතින අතර පාලක සභාව විසින් මීට අදාලව ගනු ලබන තීරණය මත ඉදිරි කටයුතු සිදු කිරීමට අපේක්ෂිත බව ඔබ වෙත කාරුණිකව දන්වා සිටිමි | පර්යේෂණ මාතෘකාවේ ඇතුළත්වන පරිදි සියලුම කරුණු අවරණය වන ආකාරයට පරීක්ෂාවන් සිදුකර පර්යේෂණ අරමුණු කරා ලඟා වීමට ක්‍රියා කළ යුතුය. |
| | (ii) කුරුඳු ව්‍යාපෘතියේ ව්‍යාපෘති සැලසුමට අනුව ගාල්ල, මාතර, හම්බන්තොට, රත්නපුර, කළුතර දිස්ත්‍රික්කවල කෘෂිකාර්මික බල ප්‍රදේශවලින් සාම්පල් ලබා ගැනීමට සැලසුම්කර තිබුණත් කළුතර දිස්ත්‍රික්කයෙන් එකම සාම්පලයක් හෝ ලබා ගෙන නොතිබුණු අතර, රත්නපුර දිස්ත්‍රික්කයේ ස්ථාන10 කින් | මෙම කරුණු සම්බන්ධව එස්එන්පී/එම්ආර්/සී/රු19/වි12 විගණන විමසුමට අදාල නිරීක්ෂණයන් පිළිබඳව විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ විශේෂ අවධානයට යොමු කරමින් කටයුතු කරමින් පවතින අතර පාලක සභාව විසින් මීට අදාලව ගනු ලබන තීරණය මත ඉදිරි | සැලසුම් කළ පරිදි සියලුම ප්‍රදේශ ආවරණය වන පරිදි පරීක්ෂාවන් සිදුකර අපේක්ෂිත ප්‍රතිඵලය ලඟා කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ස්ථාන 09කම සාම්පල් ලබා ගෙන නොතිබුණි. ප්‍රාදේශිය විෂමතාවය අනුව සාම්පල් ලබා නොගැනීම නිසා ව්‍යාපෘතියේ අරමුණු කරා ගමන් කිරීමට හැකිවේද යන්න ගැටළු සහගත බව විගණනයේදී නිරීක්ෂණය විය. | කටයුතු සිදු කිරීමට අපේක්ෂිත බව ඔබ වෙත කාරුණිකව දන්වා සිටිමි | |
| (iii) | උක්ත ව්‍යාපෘතිය යටතේ වූ පර්යේෂණයට අදාළව දර්ශනපති උපාධි පඨමාලා 02ක් පිරිනැමීමට සැලසුම් කර තිබුණි. ඒ අනුව පර්යේෂණ අරමුණු සාක්ෂාත් කර ගැනීමට අදාළ වන පරිදි රසායනික සංයුතියේ වෙනස්වීම,ජෛව ක්‍රියාකාරිත්වය හා එයට අදාළ සංයෝග හඳුනා ගැනීම සහ කුරුඳුවල පවතින රසායනික සංයුතියේ ගුණාත්මකව හා ප්‍රමාණාත්මකව විශ්ලේෂණය, ප්‍රති ඔක්සි කාරක ගුණ ප්‍රති පිළිකා කාරක ගුණ, දියවැඩියා නාශක ගුණ පිළබඳ අධ්‍යයන කිරිම නැමැති මාතෘකා 02 යටතේ පරීක්ෂා කිරීමට සැලසුම් කර තිබුණි. නමුත් වර්ෂ 02 ක් පමණ ගිය පසු පර්යේෂණ නිබන්ධනයේ අධීක්ෂක විසින් පර්යේෂණ මාතෘකාව වෙනස් කර තිබුණි. මෙලෙස පර්යේෂණ අධ්‍යන ක්ෂේත්‍රය වෙනස් කිරීම මඟින් ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණ කරා ලඟා විය නොහැකි බවට නිරීක්ෂණය කෙරේ. | මෙම කරුණු සම්බන්ධව එස්එන්පී/එම්ආර්/සී/රු.වි19/ වි.12විගණන විමසුමට අදාල නිරීක්ෂණයන් පිළිබඳව විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ විශේෂ අවධානයට යොමු කරමින් කටයුතු කරමින් පවතින අතර පාලක සභාව විසින් මීට අදාලව ගනු ලබන තීරණය මත ඉදිරි කටයුතු සිදු කිරීමට අපේක්ෂිත බව ඔබ වෙත කාරුණිකව දන්වා සිටිමි. | මෙම ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු ලඟා කර ගැනීමට දර්ශනපති උපාධි පාඨමාලා 02 හරහා අපේක්ෂිත ප්‍රතිඵල ලඟා කර ගැනීමට ක්‍රියා කළ යුතුය. |
| (ඊ) | සාමාන්‍ය ශාස්ත්‍රවේදී බාහිර උපාධි පාඨමාලාව පරීක්ෂණ අදියර 03 ක් යටතේ පවත්වා තිබුණු අතර, පරීක්ෂණ වාර්ෂිකව පැවැත්විය යුතු බවට සනාතන සභාව විසින් පනවන ලද නියෝග අනුව දැක්වේ. එසේ වුවද එක් එක් අදියර සඳහා පාඨමාලාවේ ලියාපදිංචි වූ සිසුන් වෙනුවෙන් පරීක්ෂණ පැවැත්වීම වර්ෂ 01 ත් 03 ත් අතර කාල පමාවකින් පසුව පවත්වා තිබුණි. මේ අනුව උපාධි අපේක්ෂකයින්ට තම උපාධිය සම්පූර්ණ කිරීමට වර්ෂ 06 කට වැඩි | පාඨමාලාවේ විභාග වාර්ෂිකව පැවැත්වීමට නොහැකි වී ඇති කරුණු අතර සම්මන්ත්‍රණ දේශන, පිළිතුරු පත්‍ර පරීක්ෂාව, ප්‍රතිඵල මණ්ඩල පැවැත්වීම යනාදී සියලූ කටයුතු සිදු කරන්නේ මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයේ ආචාර්යමණ්ඩලයේ සහභාගීත්වයෙන් වන අතර එම පිරිසට අයත් පීඨ රාජකාරී සමග නොගැටෙන පරිදි දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන | මෙම ක්‍රියා වලිය කඩිනම් කර අවම කාලයකින් උපාධිධාරියකු බිහිවීමට හැකිවන ආකාරයට සැලසුම් සකස්කර එය ක්‍රියාත්මක කිරීම හා තරුණ ජවය රැකියා වෙළඳපොළ සඳහා අවශෝෂණය කිරීමට හැකිවන වැඩ පිළිවෙලක් ස්ථාපිත කළ යුතුය. |

| | | |
|---|---|---|
| කාලයක් ගත වී තිබුණු බව නිරීක්ෂණය විය. | ඒකකයේ කටයුතු යොදා ගැනීමට සිදු වේ. මීට අමතරව අධ්‍යයන, අනධ්‍යයන හා ශිෂ්‍ය යන පාර්ශවයන් තුනෙහිම වෘත්තීය ක්‍රියාමාර්ග ද විභාග නිසි පරිදි පැවැත්වීමට බාධා වී ඇත. | |

## 3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1998 අගෝස්තු 18 දිනැති අංක 737 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය ගිවිසුම් හා බැඳුම්කර කඩ කිරීමෙන් ලැබෙන සියලුම මුදල් ස්ථාවර තැන්පතුවල හා භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කර එම ආයෝජනයෙන් ලැබෙන පොළී ආදායම විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩල වෙනුවෙන් දේශීයව සංවිධානය කරනු ලබන සැසි, පුහුණු හා කෙටිකාලීන පුහුණු පාඨමාලා සඳහා මෙන්ම පර්යේෂණ හා ප්‍රකාශන එළිදැක්වීම සඳහා අවශ්‍ය මුදල් සපයා ගැනීම වෙනුවෙන් දැරිය යුතු බවට දක්වා තිබේ. නමුත් විශ්වවිද්‍යාලය විසින් 2019 දෙසැම්බර් 06 දින වන විට ගිවිසුම් හා බැඳුම්කර කඩකල නිලධාරීන්ගෙන් රු. 40,200,000 ක මුදලක් අයකරගෙන ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණු අතර, ඉන් උපයන ලද රු. 5,005,610 ක් වූ පොළී ආදායම උක්ත චක්‍රලේඛ විධිවිධාන වලට අනුව කටයුතු නොකර ස්ථාවර තැන්පතු අරමුදල් ගිණුමට බැර වන ආකාරයට ආයෝජනය කර තිබුණි. | ඉදිරියේදී උක්ත චක්‍රලේඛය ප්‍රකාරව පොලී ආදායම වැය කිරීම සම්බන්ධයෙන් නිර්ණායක හා ප්‍රතිපත්ති මාලාවක් සකස් කර පාලක සභාවේ අනුමැතිය අනුව එම මුදල් උපයෝජනය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ඇත. | කාර්ය මණ්ඩල පුහුණුව සඳහා ඒකා බද්ධ අරමුදලේ මුදල් භාවිතා නොකර චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව මෙම අරමුදලේ පොලී ආදායම භාවිතා කළ යුතුය. |
| (ආ) | 2018 නොවැම්බර් 26 දිනැති අංක 15/2018 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය ප්‍රකාරව විශ්වවිද්‍යාල කාර්යමණ්ඩලය සඳහා අග්‍රහාර රක්ෂණ යෝජනා ක්‍රමයක් හඳුන්වා දීමට අවශ්‍ය ප්‍රතිපාදන සලසා දී තිබුණි. ඒ අනුව ජාතික රක්ෂණ භාර අරමුදලක් පිහිටුවීමටත් එහි වාරික මුදල් ගෙවීම සඳහා සේවක දායකත්වය ලබා ගැනීම මඟින් හෝ විශ්වවිද්‍යාලයේ ස්වයං උත්පාදිත අරමුදල් මඟින් උපයෝජනය කළ යුතු බවත් දැක්වුවද, ඊට අනුකූල නොවන පරිදි විශ්වවිද්‍යාල ඒකාබද්ධ අරමුදලින් | රක්ෂණ අරමුදල සඳහා යොදාගත් ඉහත අරමුදල් පාලක සභාවේ අනුමැතිය අනුව ලබාගත් අතර , ඒවා විශ්වවිද්‍යාලයට භාණ්ඩාගාරයෙන් ලද අරමුදල් නොවන අතර විශ්වවිද්‍යාලය විසින් උත්පාදනය කර ගත් ආදායම් බව විගණනයේ අවධානයට යොමු කරමි. | අදාල ආදායම් හා අරමුදල් ස්වයං උත්පාදිත අරමුදල් නොවන බැවින් අග්‍රහාර රක්ෂණ අරමුදලක් පිහිටුවීම සඳහා යෙදවිය නොහැකි අතර ඒවාට අදාල නිශ්චිත අරමුණු ඉටුකර ගැනීම වෙනුවෙන් යෙදවිය යුතුය. |

රු.මිලියන 20 ක් , විශ්වවිද්‍යාල සංවර්ධන අරමුදලින් රු. මිලියන 10 ක් හා ගිවිසුම් කඩකිරීම හේතුවෙන් සැපයුම් කරුවන්ගෙන් අයකර ගන්නා මුදලින් රු.මිලියන 10ක් වන පරිදි එකතුව රු. මිලියන 40 ක අග්‍රහාර රක්ෂණ අරමුදලක් පිහිටුවා තිබුණි.

### 3.4 අරමුදල් ඌන උපයෝජනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතුව රු.31,063,277 ක් වූ පර්යේෂණ ආධාර ශේෂය තුල 2014 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා උපයෝජනය නොකල පර්යේෂණ ආධාර රු.2,127,809ක් වූ අතර, එම ආධාර අරමුදල් ඌන උපයෝජිතව පැවතීමට හේතු සොයා බලා ඒවා ඵලදායීව උපයෝජනය කිරීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමුවී නොතිබුණි. | ඌන උපයෝජිත පර්යේෂණ ආධාර ව්‍යාපෘති නිර්ණායකයන්ට හා අයවැයන්ට යටත්ව උපයෝජනය කරන මෙන් අදාල නිලධාරීන් දැනුවත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇති අතර, අක්‍රිය හා අවසන් වූ පර්යේෂණ ව්‍යාපෘතියන්හි ශේෂයන් සම්බන්ධයෙන් ඉදිරියේදි මුදල් අනුකමිටුවේ හා පාලක සභාවේ උපදෙස් අනුව කටයුතු කරනු ලැබේ. | ඌන උපයෝජිත පර්යේෂණ ආධාර ඵලදායීව උපයෝජනය කිරීමට ක්‍රියා කළ යුතුය. |
| (ආ) | මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ත්‍යාග සහ පරිත්‍යාග ගිණුමේ රු.612,906,756 ක ශේෂ එකතුවක් පැවති අතර, එම ගිණුම් අතුරින් එකතුව රු.12,918,952 ක් වූ ගිණුම් 22 ක් වර්ෂ 03 සිට වර්ෂ 05 ක් දක්වා කාලයක් අක්‍රිය තත්ත්වයේ පැවතුණි. එම අරමුදල් අදාල කාර්යයන් වෙනුවෙන් යෙදවීමකින් තොරව ඌන උපයෝජිතව පැවතීම සම්බන්ධයෙන් කළමනාකරණයේ අවධානය යොමුවී නොතිබුණි. | ඌන උපයෝජිත පරිත්‍යාග හා අරමුදල් ගිණුම්හි ශේෂයන් අරමුදලේ නිර්ණායකයන්ට හා අයවැයන්ට යටත්ව උපයෝජනය කරන මෙන් අදාල නිලධාරීන් දැනුවත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත. | ඌන උපයෝජිත ත්‍යාග හා පරිත්‍යාග සඵලදායීව උපයෝජනය කිරීමට ක්‍රියා කළ යුතුය. |
| (ඇ) | ගොවීන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම හා ගොවීන්ට ස්වයං අධ්‍යයනය තුළින් තම වගා කටයුතු වර්ධනය කිරීමට අත්වැලක් සැපයීම තේමාව කරගනිමින් L3F ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණි. මෙම ව්‍යාපෘතියේ එක් කාර්යයක් ලෙස අගය එකතු කිරීමේ නිෂ්පාදන හඳුන්වාදීම හා ව්‍යාපාර | බිම්මල් ආශ්‍රිත අගය එකතු කල නිෂ්පාදන ගොවීන්ට හඳුන්වා දීම සඳහා ව්‍යාපෘතිය මඟින් වැඩමුළු දියත් කරන ලදී. එමගින් කළ හැකි දේ පිළිබඳව ඔවුන්ව දැනුමෙන් සවිබල ගැන්වීම පමණක් මෙම | මෙම ක්ෂේත්‍රයේ නියලෙන ගොවීන් ඉතා අඩු ආදායම්ලාභීන් බැවින් ව්‍යාපාරය පුළුල් කිරීම සඳහා මූල්‍ය ආධාර ද ලබා ගැනීමට හැකිවන ලෙස ව්‍යාපෘතිය සැලසුම් |

| | | |
|---|---|---|
| සැලැස්මක් සැලසුම් කර ගන්නා ආකාරය සම්බන්ධයෙන් ගොවීන් දැනුවත් කිරීම හඳුනා ගෙන තිබුණු අතර, ඒ සඳහා අච්චාරු, මෝජු, චට්නි, බයිම් වැනි බිම්මල් ආශ්‍රිත නිෂ්පාදන සම්බන්ධයෙන් පුහුණුවක් තෝරාගත් බිම්මල් වගාකරුවන් පිරිසක් වෙත 2018 වර්ෂයේදී පවත්වා තිබුණි. නමුත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එකම ගොවි මහතෙකු හෝ ආශ්‍රිත නිෂ්පාදන හා සම්බන්ධ කර්මාන්තයේ නියැලී නොමැති බවත්, අතුරු නිෂ්පාදන සඳහා යෙදවීමට තරම් අතිරික්ත නිෂ්පාදන ගොවි මහතුන් සතුව නොමැති බවත් නිරීක්ෂණය විය. | ව්‍යාපෘතිය මඟින් සිදු කරන ලදී. ඒවාට ආනයනය කරන ලද ආහාර ද්‍රව්‍ය (බිම්මල් නිශ්පාදන) සමඟ තරඟකිරීමට නම් ගුණාත්මකභාවයකින් නිෂ්පාදනය කළ යුතු අතර පාරිභෝගික ආකර්ෂණය රාජ්‍ය ප්‍රතිපත්ති හා සැසඳීමත් ගොවින් සිය ව්‍යාපාර පුළුල් කල යුතුය. එසේ නොවුනහොත් අඛණ්ඩ නිෂ්පාදනයක් ලබා දිය නොහැක. | කලේ නම් වඩා සාර්ථක ව්‍යාපෘතියක් විය හැකි බැවින් ඒ පිළිබඳවද අවධානය යොමු කර ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතුය. |

## 3.5 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කුරුඳු පර්යේෂණ ව්‍යාපෘතිය මඟින් රු.3,955,000ක් වැයකර 2018 අප්‍රේල් 26 දින GC උපකරණයක් මිලදී ගෙන තිබුණි. විගණිත දින වූ 2019 දෙසැම්බර් වන විටත් කිසිදු පර්යේෂණ කටයුක්තකට භාවිතා කර නොතිබුණු අතර, එය භාවිත තත්ත්වයේ ද නොපැවතුණි. | මෙම කරුණු සම්බන්ධව එස්එන්පී/එම්ආර්/සී/රු19/වි.12 විගණන විමසුමට අදාල නිරීක්ෂණයන් පිළිබඳව විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ විශේෂ අවධානයට යොමු කරමින් කටයුතු කරමින් පවතින අතර පාලක සභාව විසින් මීට අදාලව ගනු ලබන තීරණය මත ඉදිරි කටයුතු සිදු කිරීමට අපේක්ෂිත බව ඔබ වෙත කාරුණිකව දන්වා සිටිමි. | අවශ්‍යතාවය හඳුනා ගෙන ප්‍රාග්ධන වත්කම් මිලදී ගැනීම සඳහා මුදල් සඵලදායීව උපයොජනය කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමුකළ යුතුය. |

## 3.6 ප්‍රසම්පාදන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වැය ශීර්ෂය යටතේ ප්‍රතිපාදිත මුදල ඉක්මවා වියදම් කිරීම හේතුවෙන් ප්‍රාග්ධන ව්‍යාපෘති 15කට අනුකූලව ප්‍රතිපාදිත මුදල ඉක්මවා රු.143,581,874 ක වියදමක් දරා එම වියදම බැදීම් ලෙස දක්වා තිබුණි. | 2019 වර්ෂයේ රුහුණ විශ්වවිද්‍යාලය සඳහා වෙන් කරන ලද ප්‍රාග්ධන සමූහ ප්‍රතිපාදන (Capital Block Grant) රු.මි. 604 ක් වුවත් 2019 වර්ෂයේ සත්‍ය වශයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදානය රු.මි. 340 ක් වූ අතර | ප්‍රාග්ධන වත්කම් අත්පත්කර ගැනීමේදී ලැබී ඇති ප්‍රතිපාදන මුදල කෙරෙහි අවධානය යොමු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | ඒ හේතුවෙන් ප්‍රාග්ධන වැය ඇස්තමේන්තු සඳහා වෙන් කරන ලද රු.මිලියන 264 ක හිඟයක් පැවතුණි. | |
| (ආ) | SLUG ක්‍රීඩා උළෙල සංකේත වත් කරමින් මොණරාගේ නිල සලකුණු සහිත ටී ෂර්ට් 4,000 ක් මුද්‍රණය කර තිබුණු අතර 2020 ජනවාරි වන විටත් රු.1,262,030 ක් පිරිවැය වූ ටී ෂර්ට් 2086 ක් හා රු.412,275 ක් වටිනා විකිණීම සඳහා මිලදී ගෙන තිබුණු භාණ්ඩ තොගයක් ඉතිරි වී තිබුණි. | සමාරම්භක හා සමාප්ති උත්සවවලදී ශිෂ්‍ය සහභාගිත්වය අවම මට්ටමක පැවතීම හා ක්‍රීඩා සමාරම්භක හා සමාප්ති උත්සවය පැවැත්වීමට කටයුතු කර තිබූ විවෘත ක්‍රීඩාංගනය වෙනුවට එම කාලපරිච්ඡේදය තුළ පැවති අධික වර්ෂාපතනය හා බලපාන ලද වෙනත් කරුණු ද මත ගෘහස්ත ශ්‍රවණාගාරය (RTMA) යොදා ගැනීම හේතුවෙන් මෙම සැමරුම් වල අලෙවිය සඳහා අවස්ථාව නොලැබීමට බලපාන ලදී. | රජයේ මුදල් උපරිම ඵලදායිව උපයොජනය කිරීමට ක්‍රියා කළ යුතුය. |

## 3.7 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ 2012 අගෝස්තු 07 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2012 හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.13.4 අනුව කොන්ත්‍රාත් විචලනය අවම කර ගැනීම සඳහා ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් සෑම වෘත්තිමය ප්‍රයත්නයක් දරන බවට වගබලා ගත යුතු ලෙස දක්වා තිබේ. එසේ වුවද විද්‍යාපීඨයේ අලුත්වැඩියා කිරීමේ කාර්මාන්තයේ මුල් ඇස්තමේන්තුවේ ප්‍රමාණයන් හා අවසාන බිල්පතේ සඳහන් ප්‍රමාණයන් අතර අයිතම 70 කින් අයිතම 24 සියයට 14 ත් සියයට 148ත් අතර විචලනයක් වී තිබුණි. | අලුත්වැඩියා කටයුතු වලට අදාළ කොන්ත්‍රාත් සිදුකිරීමේදී විවිධ ආකාරයෙන් මතුවන ගැටළු ප්‍රමාණ පත්‍ර සකස් කිරීමට පූර්ව වශයෙන් හඳුනාගත නොහැකි හෙයින් අයිතමයන්ගේ විචලනයක් සිදු වීමට ඉඩ ඇති බව සඳහන් කරමි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය හා මුදල් හා ක්‍රම සම්පාදන චක්‍රලේඛ ප්‍රකාරව හැකිතාක් දුරට කොන්ත්‍රාත් මිල විචලනය අවම වන ආකාරයට ප්‍රමාණ බිල්පත් සැකසීම සිදු කළ යුතුය. |

## 3.8 මානව සම්පත් කළමනාකරණය

### අධ්‍යයන කාර්ය මණ්ඩලය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යාපීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය දේශන පැවැත්වීමේ කාර්යසාධනය සම්බන්ධ පරීක්ෂාව | ආචාර්යවරුන්ට සමාසිකයන් තුළ දේශන පැය ගණන් පැවරීමේ දී ඔහු නියැලී සිටින වෙනත් අධ්‍යයන කටයුතු ද සැලකිල්ලට ගනී. පශ්චාත් | උප කුලපතිගේ අංක 03/2016 හා 2016 දෙසැම්බර් 30 දිනැති චක්‍රලේඛ විධිවිධාන |

| | | | |
|---|---|---|---|
| | සඳහා අධ්‍යනාංශ 09 කින් තොරතුරු කැඳවන ලද නමුත්, අධ්‍යනාංශ 04 ක් පමණක් තොරතුරු ඉදිරිපත් කර තිබුණි. එම තොරතුරු අනුව එක් අචාර්ය වරයකුගේ සතියක් තුළ දේශන පැවැත්වීමේ කාර්ය සාධනය පැය 03 ත් පැය 14.8 ත් අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි. | උපාධි අධ්‍යයන කටයුතු වල නියැලී සිටින ආචාර්යවරුන්ට (පූර්ණ කාලීන නිවාඩු නොලබා පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු වල නියැලී සිටින ආචාර්යවරුන්ට) සාමාන්‍යයෙන් දේශන පැය පැවරීමේ දී ලිහිල් පිළිවෙතක් අනුගමනය කරති. එසේම වැඩ ආවරණය කිරීම සඳහා වෙනත් ආචාර්යවරුන්ගේ සේවය ලබා ගන්නා බැවින් මෙම අවධිමත් දේශන පැය බෙදා හැරීම දක්නට ලැබේ. මෙම තත්ත්වය අධ්‍යයන වර්ෂයෙන් වර්ෂයට වෙනස් වේ. | පරිදි කටයුතු කර මානව සම්පතෙන් උපරිම ප්‍රයෝජන ලබා ගැනීමට ක්‍රියා කළ යුතුය. |
| (ආ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ලේකම්ගේ අංක UGC/AC/QA/GEN හා 2015 මැයි 07 දිනැති ලිපිය පදනම්ව අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා ආචාරධර්ම හා ශාස්ත්‍රීය වගකීම් සම්බන්ධයෙන් නිකුත් කරන ලද උපකුලපතිගේ අංක 03/2016 හා 2016 දෙසැම්බර් 30 දිනැති අභ්‍යන්තර චක්‍රලේඛය අනුව ආචාර්යවරුන් විසින් පැවැත්විය යුතු දේශන පැය ප්‍රමාණයට වඩා අඩුවෙන් දේශන පවත්වා තිබුණු අවස්ථා පැවතුණි. එනම් නියමිත දේශන පැය ප්‍රමාණයට වඩා සියයට 80ත් සියයට 13ත් අතර පරාශයක ප්‍රමාණයක් අඩුවෙන් ආචාර්යවරු 08 දෙනෙකු විසින් දේශන පවත්වා තිබුණි. | යම් යම් අත්‍යාවශ්‍ය කටයුතු වල නියැලීම පශ්චාත් උපාධි පර්යේෂණ කටයුතු හා වෘත්තිය සඳහා පූර්ව අවශ්‍යතා පාඨමාලා හැදෑරීම සඳහා අචාර්යවරුන් නිවාඩු නොලබා එම කාර්යන් වල නිරත වී සිටින අවස්ථාවල දී ඔවුන්ට සාමාන්‍යයෙන් අඩු දේශන පැවරීමක් දෙපාර්තමේන්තු මට්ටමේ දී සිදු කරනු ලැබේ. | උප කුලපතිගේ අංක 03/2016 හා 2016 දෙසැම්බර් 30 දිනැති චක්‍රලේඛ විධිවිධාන පරිදි කටයුතු කළ යුතුය. |
| (ඇ) | මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයේ අධ්‍යනාංශ දෙකක සිටින අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සියයට 25 කට වඩා වැඩි ප්‍රමාණයක් අධ්‍යයන හා සප්තවාර්ෂික නිවාඩු ලබා තිබුණි. | ඇතැම් අවස්ථාවල ජ්‍යෙෂ්ඨ ආචාර්යවරු සප්ත වාර්ෂික නිවාඩු ලබා තිබෙන අවස්ථාවලදී ආධුනික කථිකාචාර්යවරුන් උසස් අධ්‍යාපනය සඳහා යොමු කිරීමේ අවස්ථාවන්ට එළඹේ. අධ්‍යනාංශයේ අනෙකුත් ආචාර්යවරුන්ගේ එකඟතාවය මත එවැනි නිවාඩු ලබා දීමක් සිදුවේ. | මානව සම්පත උපරිම කාර්යක්ෂමතාවයෙන් උපයෝජනය කළ යුතු ය. |

## 4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

### 4.1 සංයුක්ත සැලැස්ම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සංයුක්ත සැලැස්ම අනුව 2018 වර්ෂය වන විට නව දුරස්ථ පාඨමාලා 22 ක් හා මාර්ගගත පාඨමාලා 01 ක් ආරම්භ කිරීමට සැලසුම් කර තිබුණත් එක පාඨමාලාවක් හෝ මෙම කාල වකවානුව තුළදී ආරම්භ කර නොතිබුණි. | සාමාන්‍යයෙන් සංයුක්ත සැලසුම් තුළ අඩංගු සියලුම කරුණු සියයට සියයක් අත්පත් කර ගැනීමක් අපේක්ෂා කරන නමුත් එය ප්‍රායෝගික නොවේ. ආයතනයේ අභ්‍යන්තර පරිසරයේ ඇතිවන විවිධ ඍණාත්මක බලපෑම් හේතු මත සංයුක්ත සැලැස්මේ අපේක්ෂිත ප්‍රතිඵල ඒ ආකාරයෙන් අත්පත් කර ගත නොහැකි වනු ඇත. | තාර්කිකව සැලසුම් සකස් කර ඒ අනුව ඉලක්ක පිහිටුවා ඒවා සාධනය කර ගැනීමට කළමනාකරණය ක්‍රියා කළ යුතුය. |
| (ආ) | 2012 - 2016 සංයුක්ත සැලැස්ම අනුව මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය මගින් දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන බාහිර උපාධි පාඨමාලා 06 ක් ආරම්භ කිරීමට සැලසුම් කර තිබූ නමුත්, එකම පාඨමාලාවක් හෝ ආරම්භ කර නොතිබුණි. සංයුක්ත සැලසුම්වල ඇතුළත් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමු වී නොතිබුණි. | සාමාන්‍යයෙන් සංයුක්ත සැලසුම් තුළ අඩංගු සියලුම කරුණු සියයට සියයක් අත්පත් කර ගැනීමක් අපේක්ෂා කරන නමුත් එය ප්‍රායෝගික නොවේ. ඒ අනුව දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාප ඒකකයේ දැක්ම කරා ක්‍රියාත්මක වීම සඳහා සියලු ක්‍රියා මාර්ග ගනු ලබන අතර අවස්ථානුකූල ලෙස සිදුවන බාහිර පාරිසරික ඍණාත්මක බලපෑම් මත මෙන්ම ආයතනයේ අභ්‍යන්තර පරිසරයේ ඇතිවන විවිධ ඍණාත්මක බලපෑම් හේතු මත සංයුක්ත සැලැස්මේ අපේක්ෂිත ප්‍රතිඵල ඒ ආකාරයෙන් අත්පත් කර ගත නොහැකි වනු ඇත. | තාර්කිකව සැලසුම් සකස් කර ඒ අනුව ඉලක්ක පිහිටුවා ඒවා සාධනය කර ගැනීමට කළමනාකරණය ක්‍රියා කළ යුතුය. |

### 4.2 තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වර්තමාන ලෝකයේ බොහොමයක් විශ්වවිද්‍යාල තුළ උපාධි පාඨමාලා තාක්ෂණය මුල්කරගෙන මාර්ග ගත පාඨමාලා වශයෙන් ( Online) පැවැත්වීමේ ප්‍රවනතාවයක් පවතී. රුහුණ විශ්වවිද්‍යාලය තුළද විවිධ විෂය ක්ෂේත්‍ර ආවරණය වන පරිදි බාහිර උපාධි පාඨමාලා මාර්ග ගතව පවත්වාගෙන යන්නේ නම් මෙම උපාධි පාඨමාලාවන් | ඉදිරියේදී ඒකකය මඟින් සිදු කරන පාඨමාලාවන් මාර්ගගත හා සිසුන් කැඳවා පවත්වන , යන දෙකෙහිම සම්මිශ්‍රණය වු (Hybrid) ක්‍රමයට පැවැත් වීම පිළිබඳව අවධානය යොමුව ඇත. | වර්තමාන ලෝකයේ බොහොමයක් පාඨමාලා මාර්ගගතව පවත්වනු ලබන අතර, ඒ තුළින් දේශීය මෙන්ම විදේශ ලෝකයටද විවෘත වීමේ හැකියාවක් පවතී. තවද එම ක්‍රමයේ ඇති ප්‍රතිලාභද අත්කර ගත හැකිය. එබැවින් වර්තමාන ලෝකයේ ඇති |

ශ්‍රී ලංකාව පුරා මෙන්ම විදේශ රටවලටද විවෘත වීමේ හැකියාවක් පවතී. මෙලෙස උපාධි පාඨමාලා ආරම්භ කිරීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමු නොකිරීම නිසා විශ්වවිද්‍යාලයට මෙන්ම සමාජයට ද අත්කර ගැනීමට හැකිව තිබුණු ප්‍රතිලාභ අත්කර ගැනීමට නොහැකි වී තිබුණි.

ප්‍රවනතා කෙරෙහිද අවදානය යොමු කළ යුතුවේ.